# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2393/27 – 2024 ජූලි මස 17 වැනි බදාදා – 2024.07.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත 1 ඡේදයේ විස්තර කරනු ලබන පරවශතාවය, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශතාවය අත්කර ගනු ලබන්නේ කවර ඉඩමකින් ද යන්න 2 ඡේදයේ විස්තර වේ.

1. **පරවශ්‍යතාවේ විස්තරය.–** මීගමුව අපජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ඕවිටියාවත්ත අපජල නලයක් එලීම සඳහා මීටර් 5ක් පළල මාර්ගයක පරවශ්‍යතාව අත්කර ගැනීම.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 77, උතුරු පල්ලන්සේන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඕවිටියාවත්ත ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක GA/NEG/2021/536 සහ 2022.04.04 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර **‘A’ – ඉඩමේ නම සොයාගත නොහැක – ප්‍රමාණය: හෙක්. 0.0599**

උතුරට, නැගෙනහිරට සහ දකුණට: කේ. එල්. සී. ඒ. පෙරේරා හිමිකම් කියන ඉඩම; බටහිරට: පාර සහ කේ. එල්. සී. ඒ. පෙරේරා හිමිකම් කියන ඉඩම.

හරින් ප්‍රනාන්දු,<br>
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2021/WS/129.<br>
2024 මැයි මස 28 වැනි දින,<br>
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,<br>
''මිහිකත මැදුර'',<br>
රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.

EOG 07 – 0153